ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී උපාධි පාඨමාලාව - 6 වන මට්ටම
අවසාන පරීක්ෂණය - 2021/2022
LLU6716/LWU4324- වාණිජ නීතිය
කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2022.12.27 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30

---

ප්‍රශ්න සංඛ්‍යාව 08 යි.

ප්‍රශ්න පහක් (05) සඳහා පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

01. පහත මාතෘකා අතරින් ඕනෑම දෙකක් (02) විස්තර කරන්න. ඔබගේ පිළිතුරට අදාල ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන පවතී නම් ඒවා සහ නඩු තීන්දු ඇතුළත් කල යුතු ය.

(අ) "කිසිවෙකුට තමන්ට නොමැති දෙයක් පැවරිය නොහැක." (nemo dat quod non habet) යන මූලධර්මයේ වැදගත්කම සහ ඊට අදාල ව්‍යාතිරේඛ පැහැදිලි කරන්න.

(ආ) 1980 අංක 26 දරණ (සංශෝධිත) ආහාර පනතේ විධිවිධාන මඟින්,අසාධාරණ වෙළඳ පිළිවෙත් වලින් පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමට උත්සාහ කරන්නේ කෙසේදැයි විග්‍රහ කරන්න.

(ඇ) චෙක්පතක් රේඛනය කළ හැකි ආකාරය සහ එවැනි රේඛනය කිරීමක් මඟින් චෙක්පතේ සැබෑ හිමිකරු ආරක්ෂා කරන ආකාරය විස්තර කරන්න. (ලකුණු 10 x 02 = 20)

02. (අ) "රක්ෂණ ගිවිසුමක් බලාත්මක කිරීමට නම් රක්ෂිතයාට රක්ෂණීය හිමිකමක් (insurable interest) තිබිය යුතු ය."

ඉහත ප්‍රකාශය අධිකරණ තීරණ ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(ආ) ICD රක්ෂණ සමාගම විසින් වසර 06 ක් සඳහා මූලික දේපල ආරක්ෂණ ආවරණයක් පිළිබඳ දැන්වීමක් පළ කරන ලදී. එම දැන්වීමෙ සඳහන් වන්නේ දේපළ ආවරණයන් සඳහා අඩුම මිළ.... සියල්ල ඇතුළත් ව ..... ඕනෑම ආකාරයක දේපළ අනතුරු ආවරණය සහ අවදානම් ආවරණය වන බවත් ය. ICD රක්ෂණ සමාගම තැරැව්කරුවන් සමඟ රැස්වීමක් පැවැත් වූ අතර එම රැස්වීමේ දී ඔවුන් පෙන්වා දුන්නේ නව රක්ෂණ ආවරණය සාමාන්‍ය කටයුතු සඳහා

**THE OPEN UNIVERSITY OF SRI LANKA**

**FACULTY OF HUMANITIES AND SOCIAL SCIENCE**

**DEPARTMENT OF LEGAL STUDIES**

**BACHELOR OF LAWS DEGREE PROGRAMME– LEVEL 06**

**FINAL EXAMINATION - 2021/2022**

**LLU 6716/LWU4324– COMMERCIAL LAW**

**DURATION – ONE (03) HOURS**

Date: 27.12.2022 Time: 09.30 a.m. – 12.30 p.m.

Total Number of questions – 08

Answer **FIVE (05)** question only.

Candidates will be penalized for illegible handwriting.

**1.** Discuss any **two (02)** of the following. Your answer should include relevant statutory provisions, if any, and case law.

a) Explain the significance of the doctrine of *nemodat quod non habet* and its exceptions.

b) Discuss how the provisions of the Food Act No. 26 of 1980 (as amended) tries to protect consumers against unfair trade practices.

c) Discuss how a cheque can be crossed and explain how such action would protect the true owner of the cheque.

**(10 x 2 = 20 Marks)**

**2.** a) 'For an insurance contract to be enforceable, the insured must have insurable interest'. Discuss this statement with reference to the decided case.

**(8 Marks)**

b) ICD Insurance Company (ICD) advertised their new premium 6-year property protection cover. The advertisement states as, 'lowest price for a property cover… all in one… covers any kind of property accidents and dangers…'. ICD had a meeting with the brokers, where the company indicated that this new insurance coverage is intended for clients who use their property in a normal way. Karthik who saw the advertisement, contacted his broker to get all the information regarding the new premium cover. Then Karthik completed the insurance application form to insure his house. The form neither mentions a property inspection nor asks about the usage of the insuring property. Therefore, Karthik did not disclose to ICD that he uses the back room of the house as a chemical testing lab which is used to store

දේපළ භාවිතා කරන සේවාදායකයින් උදෙසා බවයි. ඉහත දැන්වීම දුටු කාර්තික්, තම තරුවකරුට නව මූලික (රක්ෂණ) ආවරණය පිළිබඳව සියලු තොරතුරු ලබා ගන්නා ලෙස පැවසී ය. අනතුරු ව කාර්තික් තම නිවස රක්ෂණය කිරීම සඳහා රක්ෂණ අයදුම්පත සම්පූර්ණ කලේය. එම පෝරමයේ දේපළ පරීක්ෂාවක් පිළිබඳ ව හෝ දේපළ භාවිතය පිළිබඳ කිසිවක් විමසා තිබුණේ නැත. එමනිසා තම නිවස පිටුපස කාමරය රසායනික පර්යේෂණාගාරයක් ලෙස භාවිතා කරන බව හෝ, එම කාමරය වහා ගිණි ඇවිලෙන සුළු රසායනික ද්‍රව්‍ය ගබඩා කර ඇති බව කාර්තික් සඳහන් නොකලේ ය. අනතුරුව කාර්තික්ගේ නිවසේ පිටුපස කාමරය තුළ ගින්නක් ඇති වූ අතර එමගින් මුළු නිවසටම හානි සිදුවිය. කාර්තික් තමාගේ නිවස තුළ වහා ගිණි ඇවිලෙන සුළු රසායනික ද්‍රව්‍ය ඇති පර්යේෂණාගාරයක් ඇති බව හෙලිකිරීමට අපොහොසත් වූ නිසා ICD රක්ෂණ ආයතනය විසින් රක්ෂණ ආවරණය ගෙවීම ප්‍රතික්ෂේප කරන ලදී.

ICD රක්ෂණ සමාගමට මෙවැනි ස්ථාවරයක් මත පිහිටා සිටිය හැකි ද? විස්තර කරන්න.

ඔබගේ පිළිතුර අදාල නීති මූලධර්ම සහ නඩු තීන්දු ඇසුරෙන් තහවුරු කරන්න. **(ලකුණු 12)**

03. (අ) "කුළී සින්නක්කර ගිවිසුමක කුලියට ගන්නා තැනැත්තා (hirer) භාණ්ඩය භාවිත කිරීම උදෙසා ගෙවන අතර එම භාණ්ඩයේ හිමිකම අයිතිකරු (owner) මත පවතී."

*Charanjit Singh Chadha & Ors v.Sudhir Mehra [2001]7SCC 417*

උක්ත ප්‍රකාශය සමඟ ඔබ කොතෙක් දුරට එකඟ වන්නෙහි ද?

අදාල ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ අධිකරණ තීරණ ඇසුරෙන් සාකච්ඡා කරන්න.

**(ලකුණු 08)**

(ආ) 1982 අංක 29 දරණ පාරිභෝගික ණය පනත සහ අදාල නඩු තීන්දුවලට අදාල ව කුළී සින්නක්කර ගිවිසුමක් තුළ කුළියට ගන්නා තැනැත්තාගේ වගකීම පැහැදිලි කරන්න.

**(ලකුණු 12)**

04. සමන් සහ නිරෝෂන් විසින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන අතර, ඔවුන් දෙදෙනා විසින් ACI බැංකුවේ බද්ධ ජංගම ගිණුමක් (Joint current account) මගින් තම ව්‍යාපාරයේ ගනුදෙනු සිදුකරනු ලබයි. සමන් රු.5000 ක චෙක්පතක් සකස් කර , තම ගනුදෙනුකරුවන්ට ගෙවීම සඳහා ලක්මාලි වෙත බාර දෙයි. සමන් ලක්මාලි හට පැවසුයේ එම චෙක්පත හවුල්කරුවන් දෙදෙනාම අත්සන් කළහොත් පමණක් වලංගු වන බවයි. තවද සමන් ලක්මාලිට උපදෙස් දුන්නේ නිරෝෂන් හමුවී චෙක්පත අත්සන් කරගන්නා ලෙසයි. ආර්ථික අපහසුතා සහිත ලක්මාලිට පසුදින, තම දියණියගේ පාසල් ගාස්තු ද ගෙවීමට නියමිතව තිබුණි. ලක්මාලි නිරෝෂන්ගේ අත්සන ව්‍යාජ ලෙස යොදා චෙක් පතෙහි සඳහන් මුදල රුපියල් 50,000 ලෙස වෙනස් කොට ACI බැංකුවට රැගෙන ගියා ය. එම චෙක්පතෙහි අත්සන පිළිබඳ සැක සහිත වූ බැංකු කළමනාකරු වන නාලක සමන්ට දුරකතන ඇමතුමක් ලබා දී අත්සනෙහි නිරවද්‍යතාව පිළිබඳව විමසා සිටියේ ය. එම අවස්ථාවේ, ගුවන් තොටුපලෙහි පිටවීමේ පර්යන්තයෙන් ගුවන් යානයට ගොඩවීමට සිටි සමන්ට බැංකු කළමනාකාරවරයාව පැහැදිලිව නොඇසුණු අතර සමන් "ඔව්" ලෙස පමණක් පිළිතුරු දී

several highly flammable chemicals. Subsequently, Karthik had a fire in his back room which caused damage to the entire house. ICD refuses to pay out on the policy on the ground that Karthik failed to disclose his property includes a highly flammable chemical lab. Does ICD entitle to rely on this stance? Explain.

Substantiate your answer with relevant legal principles and case law.

**(12 Marks)**

**3.** a) "[A] hirer in a hire purchase agreement is simply paying for the use of goods and title remains with the financier, who is the owner..."

*Charanjit Singh Chadha & Ors. v. Sudhir Mehra* [(2001) 7 SCC 417]

To what extent do you agree with the above statement? Discuss with reference to statutory provisions and decided cases.

**(8 Marks)**

b) Explain the obligations of a hirer under a hire purchase agreement with reference to Consumer Credit Act No.29 of 1982 and relevant case law.

**(12 Marks)**

**4.** Saman and Niroshan is having a partnership company and have a joint current account in ACI Bank to do their business transactions. Saman draws a cheque of Rs. 5000 which he hands over to Lakmali to pay the suppliers. Saman, told Lakmali that the cheque will be only valid if both partners have signed on it. Thus, Saman instructed Lakmali to meet Niroshan and get the cheque signed. However, Lakmali who had some financial difficulties, had to pay her daughter's school fees the following day. Lakmali forged Niroshan's signature and edited the amount of the cheque for Rs. 50000 and took it to the ACI bank. The bank manager Nalaka, who was suspicious about the signature called Saman and inquired whether the signatures were correct. Saman who was at the Airport and was boarding the flight in a hurry did not hear the manager and said only "yes" and then he disconnected the call. Therefore, the manager released the cheque. Later, Niroshan, who got to know about this forgery intended to file a legal action against Lakmali and the ACI Bank. Niroshan appoints you as his counsel.

Advise Niroshan on whether he can file a case against Lakmali and the ACI Bank with reference to statutory provisions and decided cases.

**(20 Marks)**

**5.** Wishva is a gardener in Nuwara-Eliya, who grows flowers professionally for wedding decorations. He entered a contract with Mahesh to get some fertilizers for the next season which falls in July. Mahesh is a registered dealer of Chapa (Pvt) Ltd, which is a leading manufacturer and seller of gardening requisites in Chilaw. Wishva agreed to buy 100kg fertilizer bags from Mahesh in two installments and Wishva paid the full amount of the first installment and agreed to pay the second installment when it is ready to be dispatched. Moreover, Wishva told Chapa (Pvt) Ltd, that he needs a good quality fertilizer, which helps him growing quality flowers to be used in wedding decorations. After Wishva used the first instalment of fertilizers as instructed, the flowers produced by the plants were poor in

දුරකතනය විසන්ධි කලේය. එමනිසා බැංකු කළමනාකරු විසින් චෙක්පත පිළිගන්නා ලදී. පසුව මේ පිළිබඳව දැනගත් නිරෝෂන් විසින් ලක්මාලිට සහ ACI බැංකුවට විරුද්ධව නඩු පැවරීමට තීරණය කරන ලදී. නිරෝෂන්, ඔබව ඔහුගේ නීතිඥවරයා ලෙස පත්කර ගනී.

අදාල ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු තීරණ ඇසුරෙන් ලක්මාලිට සහ ACI බැංකුවට විරුද්ධව නඩුවක් පැවරිය හැකිදැයි නිරෝෂන්ට උපදෙස් දෙන්න. **(ලකුණු 20)**

05. විශ්ව, නුවරඑළිය ප්‍රදේශයේ ජීවත්වන, මංගල අවස්ථාවන් සඳහා වෘත්තීමය වශයෙන් මල් වගා කරන උද්‍යාන පාලකයෙකි. විශ්ව මහේෂ් සමඟ ගිවිසුමකට එළඹුනේ ජූලි මස මීළඟ සෘතුව සඳහා පොහොර ලබා ගැනීමට ය. මහේෂ් යනු හලාවත ප්‍රදේශයේ ප්‍රධාන පෙළේ උද්‍යාන අවශ්‍යතා සඳහා වන දෑ නිෂ්පාදනය කරන සහ විකුණන Chapa (Pvt) Ltd හි ලියාපදිංචි අලෙවි නිළධාරියෙකි. විශ්ව මහේෂ්ගෙන් 100kg බරැති පොහොර බෑග් මිළ දී ගැනීමටත්, එම පිරිවැය වාරික දෙකක් මගින් ගෙවීමටත් එකඟ විය. ඒ අනුව ප්‍රථම වාරිකය සම්පූර්ණයෙන් ම ගෙවූ විශ්ව දෙවන වාරිකය භාණ්ඩ බෙදා හරින අවස්ථාවේ ගෙවීමට එකඟ විය. තවදුරටත් විශ්ව, Chapa (Pvt) Ltd වෙත කියා සිටියේ තමාට මංගල සැරසිලිවල දී භාවිත කලහැකි අන්දමේ උසස් තත්ත්වයේ මල් වගාකර ගැනීමට යොදාගත හැකි හොඳ තත්ත්වයේ පොහොර අවශ්‍ය වන බවත් ය. විශ්ව එම පළමු පොහොර වාරිකය භාවිතා කිරීමෙන් පසු ඔහුගේ මල් අස්වැන්නේ ගුණාත්මක බව අඩු වූ අතර, බොහොමයක් මල් පිපීමට පෙර මිළින විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් විශ්වට තම මංගල සාද සඳහා වන ඇණවුම් සම්පූර්ණ කිරීමට මල් යොදා ගැනීමට නොහැකි විය. මහේෂ් විසින්, පොහොරවල දෙවන කොටස බාරදීම සඳහා සම්බන්ධ කර ගැනීමට උත්සාහ දැරූ අවස්ථාවේ දී මෙම සිදුවීමෙන් කම්පනයට පත්ව සිටි විශ්ව තම දුරකථනය ක්‍රියා විරහිත කළේය. විශ්වට පසුව දැනගන්නට ලැබුණේ මහේෂ් විසින් Chapa (Pvt) Ltd හි වෙළඳ නාමය අවභාවිතා කරමින් ගුණාත්මක භාවයෙන් අඩු නිෂ්පාදන විකිණීම හේතුවෙන් ආයතනය විසින් මහේෂ්ට විරුද්ධව වාරණ නියෝගයක් ලබාගෙන ඇති බවයි. එබැවින්, විශ්ව විසින් පොහොර මිලට ගැනීමට ගිය වියදම තමාට මංගල ඇණවුම් සම්පූර්ණ කලේ නම් ඉන් ලැබිය හැකිව තිබූ ලාභය අහිමි වීමෙන් සිදු වූ හානිය සහ තම කීර්ති නාමයට සිදු වූ හානිය ද ඇතුළත් ව වන්දි ඉල්ලා නඩු පැවරීමට විශ්ව අදහස් කරයි.

උක්ත සිදුවීම ව්‍යවස්ථා ප්‍රතිපාදන සහ අදාල නඩු තීන්දු ඇසුරෙන් විවේචනාත්මකව විග්‍රහ කරන්න. **(ලකුණු 20)**

06. (අ) මාෂා යනු MHI විශ්වවිද්‍යාලයෙන් අන්තර්ජාතික වාණිජ නීතිය පිළිබඳ තම ආචාර්ය උපාධිය ලබාගත් ප්‍රසිද්ධ විද්‍යාර්ථීයෙකි. විනිමය බිල්පත් පිටසන් කිරීම යන මාතෘකාව පිළිබඳ දේශනයක් පැවැත්වීමට ඇයට ආරාධනා කර තිබේ. ඔබ මාෂාගේ පරීක්ෂණ සහයකයෙකු බව උපකල්පනය කරන්න. ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු තීන්දු සහිතව ඇයගේ දේශනය කෙටුම්පත් කරන්න. **(ලකුණු 12)**

(ආ) ධාරකයා (Holder) යථාකාලීන ධාරකයා (Holder in due course) වටිනාකමේ ධාරකයා (Holder for value) යන වචනවල වෙනසරිය සන්සන්දනය සහ විභේදනය කරන්න.

ඔබගේ පිළිතුර ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු තීන්දු ඇසුරෙන් විග්‍රහ විය යුතුය. **(ලකුණු 08)**

quality and most of them died before blooming. Consequently, Wishva could not use flowers to complete his wedding orders. Wishva who was worried switched off his phone when Mahesh tried to contact him for the delivery of the second installment of fertilizer. Later, Wishva became aware that Chapa (Pvt) Ltd had obtained an injunction order against Mahesh for breaching and misusing their registered trademark to sell other low-quality products. Wishva intends to file a legal action seeking damages including the purchase price of the fertilizer, loss of profits that he would otherwise receive upon the completion of his wedding orders, and the damage made to his reputation.

Critically evaluate the above scenario with reference to statutory provisions and relevant case law.

**(20 Marks)**

6. a) Masha is a well-known scholar who recently obtained her PhD on International Commercial Law from MHI University. She was invited to deliver a lecture on the topic 'endorsement of a bill of exchange.' Assume that you work as a research assistant to Masha. Draft the speech with reference to statutory provisions and decided cases.

**(12 Marks)**

b) Compare and contrast the scope of the term 'holder', 'holder for value', and 'holder in due course'. Your answer must include the relevant statutory provisions and case laws.

**(8 Marks)**

7. An unpaid seller is not entitled to any remedy, if the parties to a sale of goods agreement, verbally or in writing did not agree so.

Do you agree with the above statement? Critically analyze the above statement with reference to the Sales of Goods Ordinance No. 11 of 1896 and case law.

**(20 Marks)**

8. Explain the legal consequences of the following scenarios.

a) FFR Canned Foods (Pvt) Ltd had an agreement with Yash Superfoods Ltd to deliver 200 cans of tuna. When the stock was delivered to Yash Superfoods, they noticed that the delivery contained cans more than they initially ordered and some cans were not the product they ordered. Because the container was filled with 100 cans of tuna and 50 cans of red salmon and 65 cans of barbeque sauce. Advise Yash Superfoods Ltd.

**(6 Marks)**

07. “භාණ්ඩ විකිණීමේ ගිවිසුමක පාර්ශ්වකරුවන් වාචිකව හෝ ලිඛිතව එකඟ නොවූයේ නම් මිල නොලත් විකුණුම්කරුවෙකු (unpaid seller) කිසිදු ප්‍රතිකර්මයකට හිමිකම් නොකියයි.”

ඔබ ඉහත ප්‍රකාශය සමඟ එකඟ වන්නහි ද? 1896 අංක 11 දරණ භාණ්ඩ විකුණුම් ආඥාපනත සහ නඩු තීන්දු ඇසුරෙන් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. (ලකුණු 20)

08. පහත දැක්වෙන අවස්ථාවල නෛතික ප්‍රතිඵල විග්‍රහ කරන්න.

(අ) FFR Canned Food (Pvt)Ltd ආයතනය විසින් Yash Superfoods Ltd ආයතනය සමඟ ටූනා මාළු ටින් 200 ක් ලබා දීමේ ගිවිසුමකට එළඹිණි. ඒ අනුව Yash Superfoods Ltd වෙත භාණ්ඩ තොගය බාරදුන් විට ඔවුන් ඇනවුම් කල ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් බෙදාහැරීමේ කන්ටේනර්වල අඩංගු බවත්, ඒ අතරින් සමහර ටින් ඔවුන් ඇනවුම් නොකල ඒවා බවත් සඳහන් කරන ලදී. මන්දයත්, කන්ටේනර් පිරවුම් හි ටූනා ටින් 100 ක්, රතු සැමන් ටින් 50 ක් සහ බාබකියු සෝස් ටින් 65 ක් අඩංගු විය.

Yash Superfoods Ltd ආයතනය වෙත උපදෙස් දෙන්න. (ලකුණු 06)

(ආ) රේඛා රුපියල් මිලියනයක දියමන්ති මාලයක් සුභාගෙන් මිළ දී ගන්නා ලදී. ඇය එම මාලය තම මිතුරිය වන යමුනාගේ විවාහ ගිවිසගැනීමේ උත්සවයට පැළඳුවා ය. මාස තුනකට පසු යමුනාගේ නෑනා වන චිත්‍රා, රේඛාගේ මාලය දැක ඇයට පවසා සිටියේ එම මාලය තමාගේ (චිත්‍රා) බවත්, මාස හතරකට (04) පෙර සිදුවූ මංකොල්ලයකින් එය නැති වූ බවත් ය. එසේ පවසමින් චිත්‍රා විසින් රේඛාගෙන් නැවත මාලය ඉල්ලා සිටී.

රේඛාට උපදෙස් දෙන්න. (ලකුණු 06)

(ඇ) මිශ්රා, ඉමාෂාගෙන් ළදරු කොට්ට කවර 500 ක් මිළදී ගැනීමට එකඟ විය. නමුත් ඉමාෂා පවසා සිටියේ කොට්ට කවරවල වාටි මැසීමට ඇති බවත් මසා නිමකල විට මිශ්රාට දැනුම් දෙන බවත් ය. නමුත් මිශ්රා කොට්ට කවර සඳහා සම්පූර්ණයෙන් මුදල ගෙවූ අතර කොට්ට කවරවල වාටි මසා නිමකිරීමෙන් අනතුරුව තමාට දන්වන ලෙස ඉමාෂාට පැවසී ය.

අනතුරුව, කොට්ට කවර එකතු කර ගැනීම සඳහා මිශ්රා වාහනයක් සූදානම් කරනු ඇති අතර ඉමාෂා අදාල ක්‍රියාවලිය සම්පූර්ණ කල ද මිශ්රාට මෙය පැවසීමට අමතක විය. පසුදින ඉමාෂාගේ ගබඩාවේ ඇති වූ විදුලි කාන්දුවකින් හටගත් ගින්නක් මගින් සියලු ඇඳුම් තොග ගිනිගෙන දැවී ගියේය.

පාර්ශ්වයන්ට උපදෙස් දෙන්න. (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.

b) Rekha bought a diamond necklace from Subha for Rs. 1 million. She wore that to her friend Yamuna's engagement ceremony. Three months later, Yamuna's sister-in- law Chithra, saw Rekha's necklace and told her that the necklace belongs to her and that was lost in a robbery that happened four months ago. She thought of asking back the necklace from Rekha. Advise Rekha.

**(6 Marks)**

c) Mishra agreed to buy 500 baby pillow covers from Imasha. Imasha told that she must stitch the borderline of the pillow covers. Therefore, she will inform Mishra once she completed it. Mishra paid the full payment for the pillow covers and told Imasha to inform her after the process is completed. Then Mishra will arrange a vehicle to collect the pillow covers. Imasha completed the process but forgot to inform Mishra about this. The following day an electrical leakage caused a fire in Imasha's warehouse and burnt all the clothing stocks. Advise the parties.

**(8 Mark)**

*-Copyrights reserved-*